*සැ. යු.-* 2021.08.27 දින පළ වූ අංක 2,243 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,244 - 2021 සැප්තැම්බර් මස 03 වැනි සිකුරාදා - 2021.09.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1258 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 සැප්තැම්බර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති සේවයේ (III වන පන්තිය) තනතුරු සඳහා බඳවා ගැනීම - 2021**

01. මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල මහජන පුස්තකාලයන්හි, පුස්තකාලයාධිපති සේවයේ III වන පන්තියේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය/ රජය විසින් දැනුම්දෙනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතුය.

03. *වැටුප් ක්‍රමය.-* රා.ප.ච. 03/2016, MN 3-2016 වැටුප් පරිමාණය - රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550/-

04.

04.01. *මූලික සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිය සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතුය.)
(iii) අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයෙකු විය යුතුය.
(iv) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

04.02. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

04.02.01. *විවෘත බඳවා ගැනීම් :*

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම/ අයදුම්පත් කැඳවන දිනට වසර 03ක් මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු වීම ;

*සහ*

(ii) ඉල්ලුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි වීම. (දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.) ;

*සහ*

(iii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා 03න් එකකට, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ) විභාගය සමත් වීම. මින් විෂයයන් 05 ක් එකවර සමත්ව තිබීම සහ අ.පො.ස. (උ.පෙ) විභාගයේ දී ඕනෑම විෂයයන් 03 කින් සමත්ව තිබීම ;

*සහ*

(iv) *(අ)* පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම ;

*හෝ*

*(ආ)* ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම

04.02.02. *සීමිත බඳවා ගැනීම් :*

(i) මධ්‍යම පළාත් පාලන ආයතනයක පුස්තකාල සහායක/ පුස්තකාල සේවක තනතුරේ ස්ථිර කර තිබීම සහ එම තනතුරේ වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම සහ අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම (මේ සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.)

*සහ*

(i) *(අ)* පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමාවේ පළමු වසර සමත්ව තිබීම.

*හෝ*

*(ආ)* ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම.

*සටහන :-* ඉහත 04.02.01 හා 04.02.02 යටතේ වන සියලු සුදුසුකම් අයදුම්පත්‍ර කැඳවන අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

සක්‍රීය සේවා කාලය යන්නෙන් - අඩ වැටුප් සහිත හෝ වැටුප් රහිත සේවා කාලයක් හෝ සේවයේ බණ්ඩනය වී ඇති යම් කාලයක්/ කාලයන් අත්හැරීමෙන් පසුව ඉතිරි වන, මධ්‍යම පළාත් සභාවේ ව්‍යවමනාවන්ට හා/ හෝ මධ්‍යම පළාත් සභාවේ ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව ස්වකීය තනතුරට අදාළ වැටුප් වර්ධක උපයාගෙන තිබෙන හා ඒ අනුව වැටුප් ලබමින්, තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන ලද කාලසීමාවයි.

සතුටුදායක සේවා කාලය යන්නෙන් - අදාළ කාලය තුළ සාමාන්‍ය මට්ටමේ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබෙන්නා වූ ද, අත්හිටුවීමක් හෝ නතර කිරීමක් හෝ විලම්බනය කිරීමක් සිදු නොවී, නියමිත පරිදි පූර්වාසන්න වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබෙන සහ අවවාද කිරීමක් හැර, වෙනත් යම් ආකාරයක විනයානුකූල දඬුවමකට යටත් නොවී ඇත්තාවූ ද සේවා කාලයක් වේ.

04.03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත ද, 30% ක් සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මතද, බඳවා ගනු ලබන අතර, සීමිත තරග විභාගය යටතේ සුදුසුකම් ලබන්නන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී එම ප්‍රමාණය ද විවෘත තරග විභාගය යටතේ සුදුසුකම් ලබන්නන්ගෙන් ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. තරග විභාගයේ ප්‍රතිඵලවල ලකුණු ප්‍රමුඛතාව පරිදි කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගැනීම සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති හා නියමයන් අනුගමනය කරමින් පුරප්පාඩු පුරවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. මෙහි දී 1990 මාර්තු මස 09 වැනි දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධාන අනුව දිස්ත්‍රික් ජන අනුපාතය යටතේ බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

04.03.01. *විෂයයන් :*

තරග විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත විභාගයක් පැවැත් වේ.

පුස්තකාල විද්‍යාව : කාලය පැය 03 යි - ලකුණු 100
බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 යි - ලකුණු 100
සාමාන්‍ය දැනීම : කාලය පැය 01 යි - ලකුණු 100

04.03.01.01 *විවෘත තරග විභාගයේ විෂයය නිර්දේශය :*

| *විෂයය* | *විෂය නිර්දේශය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| පුස්තකාල විද්‍යාව | 1. පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය,<br>*(අ)* පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය<br>*(ආ)* පුස්තකාලයන් හි සාමාජික කාර්ය භාරය<br>*(ඇ)* පොත් සහ විවිධ ලේඛන හා ලේඛන, මුද්‍රිත නොවන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශය<br>*(ඈ)* විද්වත් වෘත්තීය සංගම්<br>i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය<br>ii. ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය පුස්තකාල සංගම්<br>*(ඉ)* පුස්තකාල වර්ග :<br>i. පාසල් විද්‍යායතන පුස්තකාල<br>ii. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පුස්තකාල<br>iii. මහජන පුස්තකාල<br>*(ඊ)* පුස්තකාල කමිටු<br>*(උ)* සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation) | කාලය පැය 03 යි | ලකුණු 100 |

04.03.01.01. විවෘත තරග විභාගයේ විෂයය නිර්දේශය :

| *විෂයය* | *විෂය නිර්දේශය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| පුස්තකාල විද්‍යාව | 2. දැනුම සහ තොරතුරු සංවිධාන,<br><br>*(අ)* ග්‍රන්ථ වර්ගීකරණය එහි අරමුණු හා ප්‍රයෝජන<br>*(ආ)* ග්‍රන්ථ වර්ගීකරණයක මූලිකාංග<br>*(ඇ)* දශම වර්ගීකරණය<br>*(ඈ)* සූචිකරණය හා එහි අරමුණු<br>*(ඉ)* AACR 2 සූචිකරණ නීති සංග්‍රහය<br>*(ඊ)* සංලේඛනය හා ග්‍රන්ථ විස්තරය<br>*(උ)* සූචි වර්ගය<br><br>3. පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා,<br><br>*(අ)* විවිධ පුස්තකාල සම්පත්<br>*(ආ)* පුස්තකාල සම්පත් තේරීමේ ක්‍රියාවලිය<br>*(ඇ)* ප්‍රතිග්‍රහණය හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය<br>*(ඈ)* පිරිසැකසුම්කරණය<br>*(ඉ)* තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය<br><br>4. තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology),<br><br>*(අ)* පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණක තාක්ෂණයේ බලපෑම | කාලය පැය 03 යි | ලකුණු 100 |
| බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලයෙහි අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. | කාලය පැය 01 යි | ලකුණු 100 |
| සාමාන්‍ය දැනීම | ජාතික කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳ අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. | කාලය පැය 01 යි | ලකුණු 100 |

04.03.01.02. *සීමිත තරග විභාගයේ විෂයය නිර්දේශය :*

| *විෂයය* | *විෂය නිර්දේශය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| පුස්තකාල විද්‍යාව | 1. පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය,<br><br>*(අ)* පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන සහ නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල<br>*(ආ)* ලේඛන කලාවේ සහ පොත් ඇතුලු ලේඛන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශනය<br>*(ඇ)* මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂය කෙරෙහි බලපෑම | කාලය පැය 03 යි | ලකුණු 100 |

| *විෂයය* | *විෂය නිර්දේශය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| පුස්තකාල විද්‍යාව | (ඇ) *පුස්තකාල වර්ග :*<br><br>i. විශේෂ පුස්තකාල<br>රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල , පර්යේෂණ පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්<br>ii. ශාස්ත්‍රීය පුස්තකාල<br>විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්<br>iii. පාසල් පුස්තකාල<br>iv. මහජන පුස්තකාල<br>v. පිරිවෙන් පුස්තකාල හා ආරාමභක/ ආගමික ආයතන පුස්තකාල<br><br>(ඉ) පුස්තකාල කමිටු - ව්‍යුහය, අවශ්‍යතාවය, වැදගත්කම හා කාර්යභාරය<br>(ඊ) පුස්තකාල වෘත්තියට අදාළ විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්යභාරය :<br>ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රී ලංකාව/ ඉන්දියාව/ ඇමරිකාව/ බ්‍රිතාන්‍යය)<br>(උ) පුස්තකාල ගොඩනැගිලි සැලසුම්කරණයේ දී සලකා බැලිය යුතු කරුණු/ පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය/ සංවිධානය හෝ වැඩි දියුණු කිරීම<br>(ඌ) පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)<br>(එ) ආපදා (Disasters) සහ ආපදා කළමනාකරණය (Disaster Mamagement)<br><br>2. *දැනුම හා තොරතුරු සංවිධානය*<br><br>(අ) ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු හා ප්‍රයෝජන<br>(ආ) ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිතා වන ප්‍රධාන වර්ගීකරණ ක්‍රම : ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය<br>(ඇ) පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය (AACR) සම්ප්‍රදාය<br>(ඈ) ග්‍රන්ථ විස්තරය<br>(ඉ) AACR 2 සංස්කරණය භාවිත කරමින් සංඛ්‍යා ලේඛන සම්පාදනය<br><br>3. *පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා*<br><br>(අ) විවිධ පුස්තකාල සම්පත්,<br>(ආ) එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත්කම<br>(ඇ) පුස්තකාල සම්පත් තේරීම ඇතුලු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය<br><br>i. පුස්තකාල සම්පත් තේරීමේ මූලධර්ම, මූලාශ්‍ර<br>ii. ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය, පිරිසැකසුම්කරණය ඇතුලු විවිධ තාක්ෂණික සේවා<br>iii. තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය<br><br>(ඈ) ප්‍රකාශන, ප්‍රකාශන හිමිකම හා වාරණය<br>(ඉ) ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය (Current Awareness Service)<br>(ඊ) පාඨක අධ්‍යාපන වැඩසටහන්<br>(උ) මහජන සම්බන්ධතා හා පුස්තකාල ප්‍රචාරණය | කාලය<br>පැය 03 යි | ලකුණු<br>100 |

| *විෂයය* | *විෂය නිර්දේශය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| | 4. තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)<br><br>(අ) පුස්තකාලවල පරිගණක භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යයන්වල දී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායිතාවය | | |
| බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා දක්වන හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. | කාලය පැය 01 යි | ලකුණු 100 |
| සාමාන්‍ය දැනීම | ජාතික කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳ අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. | කාලය පැය 01 යි | ලකුණු 100 |

විභාගය සමත්වීම සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රතිශතයක් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලබා ගත යුතුය. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

05. *අයදුම් කිරීමේ ක්‍රමය :*

i. නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශයට අනුව A4 (සෙ.මී. 21 x සෙ.මී. 29) ප්‍රමාණයේ කඩදාසි ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. (පළමු පිටුව අංක 01 සිට 07 දක්වාත්, දෙවන පිටුව 08 සිට 10 දක්වාත්, තෙවන පිටුව 11 සිට 14 දක්වාත්, සිව්වන පිටුව 15 ලෙසත් අයදුම්පත්‍රය සකස් කළ යුතුය)

ii. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2021.10.04 දිනට පෙර "පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනට රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ III වන පන්තියට බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරග විභාගය - 2021" යන වගන්තිය අදාළ පරිදි පැහැදිලි ලෙස ලිවිය යුතුය.

iii. ඔබ අයදුම් කරනු ලබන්නේ විවෘත පදනම යටතේ ද සීමිත පදනම යටතේ ද යන්න අයදුම්පතෙහි නිවැරදිව සලකුණු කළ යුතුවේ. සීමිත අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර අදාළ ආයතනයේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

iv. අයදුම්කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

මහනුවර -01 මාතලේ - 02 නුවරඑළිය - 03

v. අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් හා නිවැරදි හා පැහැදිලි අත් අකුරින් එවනු නොලබන හා කැඳවනු ලබන අවසන් දිනට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා නොමැති සහ දක්වා ඇති කොන්දේසිවලට අදාළ නොවන, අසම්පූර්ණ එමෙන්ම ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් තැපෑලේදී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

vi. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකරුවෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/ පොලිස් සේවයේ ගැසට් තනතුරක් දරණ නිලධාරියෙකු හෝ රුː 498,960/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

*සටහන :* විභාග ගාස්තු ගෙවන ලද ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ පිටපතක් අයදුම්පත්‍රය සමග නොඇමිණිය යුතුය.

06. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු වශයෙන් රුපියල් හයසියයක් (600/-) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. මෙම මුදල් ගෙවා ලබා ගත් ලදුපත හැර වෙනත් ආයතනයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බවද සැලකිය යුතුය.

07.*සේවා කොන්දේසි හා නියමයන් :*

i. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි පළාත් සභා මුදල් රීති, දෙපාර්තමේන්තු නියෝග හා විටින් විට රජය හා මධ්‍යම පළාත් සභාව විසින් නිකුත් කරන නියෝගවලටද යටත් විය යුතුය.

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුශාංගිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛයන්හි විධිවිධාන අනුව සියලුම නිලධාරීන් සේවයට බැදුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳි වසර 03 ක් තුළ ලබා ගත යුතුය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පත්වීම් දින සිට වසර 03 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් නතර කරනු ඇත.

iii. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව පත් කරනු ලබන සේවා ස්ථානයේ වසර 03 ක අනිවාර්යය සේවා කාලයකට යටත් වන අතර, එම කාල සීමාව නිමා වන තුරු ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

iv. මධ්‍යම පළාතේ ඕනෑම පළාත් පාලන ආයතනයක, මහජන පුස්තකාලයක සේවය කිරීම සඳහා එකඟ විය යුතුය.

08. *විභාග මධ්‍යස්ථානය :*

මෙම විභාගය මහනුවර නගරය තුළ පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබේ. විභාගය ආරම්භ වන දිනයේ අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුවේ.

09. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය -*

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහිමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතු ය. මේ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ඇත.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
*(ආ)* ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති වලංගු විදේශ ගමන් බලපත්‍රය
*(ඇ)* වලංගු රියදුරු බලපත්‍රය

10. *විභාගය පැවැත්වීම.-* මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පැවැත්වේ.

11. මෙම විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය සහ මෙම දැන්වීමේ සඳහන් නොවන කරුණු පිළිබඳව තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් සතුවේ.

12. බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේ දී බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් සතුවේ.

13. යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිවැරදි තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
පළාත් පාලන කොමසාරිස්,
මධ්‍යම පළාත.

2021 අගෝස්තු මස 20 වැනි දින,
මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති සේවයේ (III වන පන්තිය) තනතුරු සඳහා බඳවා ගැනීම - 2021

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

අයදුම්කරන දිස්ත්‍රික්කය හා සංකේත අංකය : ☐

අයදුම්කරන්නේ සීමිත/විවෘත : විවෘත : ☐ සීමිත : ☐ (අදාල කොටුව තුළ √ ලකුණ යොදන්න.)

පදිංචි දිස්ත්‍රික්කය : ☐ (මහනුවර - 01, මාතලේ - 02, නුවරඑළිය - 03)

01. i. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ..............................................................................................................
..............................................................................................................................................................................
..............................................................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) PERERA A.B.C.

ii. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................................................
..............................................................................................................................................................................

iii. සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ....................................................................................................................
..............................................................................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. i. ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................................................
..............................................................................................................................................................................

ii. ස්ථිර පදිංචි ලිපිනය : ......................................................................................................................................

iii. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..............................................................................................................................

iv. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .....................................................................................................................

v. මධ්‍යම පළාත තුළ පදිංචි කවදා සිට ද ? : ......................................................................................................

04. දුරකථන අංකය : .......................................................................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

(පුරුෂ - M ස්ත්‍රී - F වශයෙන් අදාළ කොටුව තුළ සඳහන් කරන්න.)

06. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E වශයෙන් කොටුව තුළ සඳහන් කරන්න.)

07. i. උපන් දිනය : ☐☐☐☐ ☐☐ ☐☐

ii. 2021.09.03 දිනට වයස : අවුරුදු :....................., මාස :...................., දින :....................

08. පුරවැසිභාවය : ..............................................................................................

09. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

i. අ.පො.ස. (සා. පෙ.) විභාගය :

ii. වර්ෂය : ................. විභාග අංකය : ....................... වර්ෂය :................. විභාග අංකය :..................

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

iii. අ.පො.ස. (උ.පෙ.) විභාගය :

වර්ෂය : ..................... විභාග අංකය : ..................................

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

iv. ලබාගෙන ඇති උපාධිය/ ඩිප්ලෝමාව පිළිබඳ විස්තරය :

| *සමත් වූ උපාධිය/ ඩිප්ලෝමාව* | *විශ්ව විද්‍යාලය/ ආයතනය* | *උපාධිය/ ඩිප්ලෝමාව වලංගු වන දිනය* |
|---|---|---|
| | | |
| | | |

v. වෙනත් වෘත්තීය සුදුසුකම් : ..........................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

10. i. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/ නැත

ii. "ඔව්" නම් විස්තර සඳහන් කරන්න ..............................................................................................................................................

.............................................................................................................................................................................................

11. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම්,

i. දැනට දරන තනතුර : ..............................................................................................................................................

ii. එම තනතුරට පත් වූ දිනය : ..............................................................................................................................................

iii. සේවා ස්ථානයේ නම හා ලිපිනය : ..............................................................................................................................................

iv. සේවා ස්ථානයේ දුරකථන අංකය : ..............................................................................................................................................

12. i. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය හා දිනය : ..............................................................................................

ii. ලදුපත ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..............................................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
| --- |

13. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳව පනවා ඇති කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙලිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පිළිගනිමි.

...................................................................,
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

දිනය : ....................................

*අත්සන සහතික කිරීම :*

14. මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................................ මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද එම ලදුපත අයදුම්පත්‍රයට නිවැරදිව අලවා ඇති බවද සහතික කරමි.

..................................................,
සහතික කරන්නාගේ අත්සන.

නම : ..............................................................................................................................

තනතුර : ..............................................................................................................................

දිනය : ..............................................................................................................................

(නිල මුද්‍රාව තබන්න)

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු/ රු: 498,960/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය)

(රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණක් අදාළ වේ.)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

15. මෙම අයදුම්කරු වන ........................................................................................................... මයා/ මිය/ මෙනවිය ....................................... ................................................................ වශයෙන් .....................................දින සිට ............................................................................ හි සේවය කරන බවත් මෙම අයදුම්පත්‍රයෙහි සපයා ඇති සියලුම තොරතුරු ඔහුගේ/ ඇයගේ පුද්ගලික ලිපි ගොනුව/ සේවා වාර්තාව සමඟ සන්සන්දනය කළ බවත්, ඒවා නිවැරදි බවත් මෙයින් සහතික කරමි. දැනට ඔහුගේ / ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක වන අතර, පසුගිය ආසන්නතම වසර 05 ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මධ්‍යම පළාත් පුස්තකාලයාධිපති තනතුරට අයදුම් කිරීමට ඔහුට/ ඇයට සියලුම සුදුසුකම් තිබෙන බවත්, පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් මුදාහැරිය හැකි/ නොහැකි බවත් සහතික කරමි.

..................................................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ..................................................................................................................
තනතුර : ..............................................................................................................
දිනය : ................................................................................................................
(නිල මුද්‍රාව තබන්න.)

09-71

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

## 2021 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **සැප්තැම්බර්** | 2021.09.03 | සිකුරාදා | 2021.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.10 | සිකුරාදා | 2021.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.17 | සිකුරාදා | 2021.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.24 | සිකුරාදා | 2021.09.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2021.10.01 | සිකුරාදා | 2021.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.08 | සිකුරාදා | 2021.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.15 | සිකුරාදා | 2021.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.22 | සිකුරාදා | 2021.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.29 | සිකුරාදා | 2021.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2021.11.05 | සිකුරාදා | 2021.10.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.12 | සිකුරාදා | 2021.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.19 | සිකුරාදා | 2021.11.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.26 | සිකුරාදා | 2021.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.